සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 14 S I

# කතෝලික ධර්මය I

කාලය පැය එකයි.

උපදෙස්:-
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා එක් එක් ප්‍රශ්නයට ① ② ③ ④ යන පිළිතුරු වලින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරා අදාල අංකයට (X) යොදා දක්වන්න.
- පිළිතුරු සැපයීම සඳහා වෙනම බහුවරණ පත්‍රයක් භාවිත කරන්න.

01. ශුද්ධ බයිබලයෙහි අඩංගු පොත් හැත්තෑ තුන ලියවී ඇත්තේ ,
1. ශුද්ධාත්මානුභාවයෙනි 2. දේවානුභාවයෙනි 3. දේව අනාවරණයෙන් 4. ආත්මානුභාවයෙනි

02. පුද්ගලයින් හෝ ජනතාවගේ ගැටලු හා ඒවාට විසඳුම් දේවවේදීය දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කරන ජනප්‍රිය ඓතිහාසික කෘතීන් දෙක වනුයේ ,
1.රූත් හා එස්තර් 2. ජෝබ් හා සිරාක් 3. එස්රා හා නෙහෙමියා 4. නාහුම් හා බාරුක්

03. "තියෝපිලස්" යන්නෙහි අර්ථය වනුයේ,
1. දෙවියන් වහන්සේගේ මිත්‍රයා. 2. දෙවියන් වහන්සේ.
3. දෙවියන් වහන්සේගේ දූතයා. 4. මැදහත් වන තැනැත්තා.

04. ශුද්ධ වූ පාවුලු තුමා විසින්ම ලියන ලද සංදේශයකි.
1. තීතස් 2. II තෙසලෝනික 3. හෙබ්‍රෙව් 4. I තෙසලෝනික

05. එළිදරව් සාහිත්‍යයේ " පරිපූර්ණත්වය" දක්වෙන සංඛ්‍යා සංකේතය වනුයේ ,
1. 7 කි. 2. 10 කි. 3. 12 කි. 4. 4 කි.

06. පැරණි ගිවිසුමෙහි ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වනුයේ කුමක්ද?
1. අගපේය. 2. යුකරිස්. 3. ඩොක්මාය. 4. හොක්මා.

07. ශුද්ධ බයිබලෙහි කෙනකු එදිනෙදා ජීවිතයට මුහුණ දෙන අවස්ථා පිළිබඳව උපදේශන ඇතුළත් ග්‍රන්ථයකි.
1. හිතෝපදේශය. 2. සලමොන්ගේ ප්‍රඥාව. 3. ධර්ම දේශකයා. 4. ගීතාවලිය.

08. ජේසුස් වහන්සේගේ මෘත දේහය කුරුසියේ බා භූමදාන කටයුතු සිදු කිරීමට ඉදිරිපත් වන්නේ,
1.ජෝසප් මෙනසස් 2. නාසරතයේ ජෝශප් 3. අරමාතියේ ජෝසෙප් 4. සීමොන්

09. ජේසුස් වහන්සේ " පව් කමා කිරීමේ බලය " අපෝස්තුළුවරුන් වෙත දානය කරන ලද්දේ කවදා ද?
1. පාස්කු ඉරුදින සවස 2. ගොබ් ඉරිදා 3. මහා බ්‍රහස්පතින්දා 4. මහා සිකුරාදා

10. "ඉන්පසු මම අලුත් අහසක් ද අලුත් පොළොවක් ද දුටිමි, පළමු අහසත් පළමු පොළොවත් පහව ගියේය''. මෙලෙස සඳහන් වනුයේ,
1. උප්පත්ති පොත. 2. එළිදරව්ව පොත. 3. ගීතාවලිය පොත. 4. හිතෝපදේශය පොත.

11. " පෙන්තකොස්ත" යන්නෙහි අර්ථය වනුයේ කුමක්ද?
1. පණහ. 2. එතෙර වීම. 3. හතලිහ. 4. ආලෝක වීම.

12. ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා ලෙස සලකනුයේ,
1. ශුද්ධ වූ මහා ජාකොබ් තුමා. 2. ශුද්ධ වූ පේදුරු තුමා.
3. ශුද්ධ වූ ජොහාන් තුමා. 4. ශුද්ධ වූ ස්තේපන් තුමා.

13. ජෙරුසලමේ ප්‍රධාන ගුරුවරයකු වූ " ගමාලියෙල් " යටතේ අධ්‍යාපනය ලැබුවේ කවුරුන් ද?
1. ශුද්ධ වූ පාවුලු තුමා. 2. ශුද්ධ වූ අන්තෝනි තුමා.
3. ශුද්ධ වූ ජාකොබ් තුමා. 4. ශුද්ධ වූ පේදුරු තුමා.

14. ශුද්ධ වූ පාවුලු තුමාගේ තෙවන ධර්ම දූත ගමනට අදාල වරණය තෝරන්න.

**A.** - සිරියාවේ අන්තියෝකිය
**B.** - පිලිප්පිය
**C.** - එපිසිය
**D.** - දර්බය
**E.** - ඇතැන්ස්

1. B, C ය   2. A, C ය   3. D, E ය   4. C, E ය

15. ශුද්ධ වූ සභාවේ දෘෂ්‍යමාන නායකයානන් වනුයේ ,
1. ශුද්ධෝත්තම පියතුමාය. 2. ජේසුස් වහන්සේය. 3. දෙවියන් වහන්සේය. 4. පේදුරු තුමාය.

16. පේදුරුතුමාගේ අනුප්‍රාප්තිකයන් හා රදගුරු තුමන්ලා විසින් පාලනය කරනු ලබන කතෝලික සභාව තුළ පවතින බව ප්‍රකාශ කරන දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ ප්‍රකාශනය වනුයේ,
1. පෙරදිග කතෝලික සභා ප්‍රකාශනය.
2. ශුද්ධ වූ සභාව පිළිබඳ ප්‍රකාශනය.
3. ඒකතාව නඟාලීම පිළිබඳ ප්‍රකාශනය.
4. දේව ජනතාවගේ පොදු වන්දනාව පිළිබඳ ප්‍රකාශය.

17. අනුරාධපුරයේ කිතුනු භක්තිකයන් සිටි බවට 6 වන සියවසේදී ලියන ලද ග්‍රන්ථයක් වනුයේ,
1. දේව වේද පුරාණය.
2. මහාවංශය.
3. චූල වංශය.
4. ටොපොග්‍රැෆියා ක්‍රිස්තියානා.

18. " කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේදී ඉටුකර ගත නොහැකිය." යන ප්‍රකාශය කරන ලද්දේ ,
1. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාය.
2. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාය.
3. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමාය.
4. ශුද්ධ වූ තෙරේසා මව්තුමියය.

19. කතෝලික ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය මෙන්ම අග්‍රස්ථානය හිමි වනුයේ,
1. ප්‍රසාද ස්නාපනයට
2. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට
3. නත්තල් මංගල්‍යයට
4. ජපමාලයට

20. දෙවියන් වහන්සේ මිසර වැසියන් වෙත එවන ලද වසංගත ගණන වනුයේ,
1. 5 කි.   2. 8 කි.   3. 10 කි.   4. 12 කි.

21. මුල් කිතුනු සංසය තුළ ද ප්‍රේමය හා සේවය අතපසු කරමින් දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගි වී ඇති බවත් , එසේ කිරීම නුසුදුසු බවත් , ශුද්ධ පාවුලු තුමා අනුශාසනා කරනුයේ කිනම් කිතුනු සංසයටද?
1. කොරින්ති සභාවට   2. රෝම සභාවට   3. ගලාති සභාවට   4. එපිසි සභාවට

22. යාග පූජා පුද කිරීම තුළ සත්ව පූජා වැදගත් වූයේ ,
1. ප්‍රධාන ජීවනෝපාය සතුන් ඇති කිරීම නිසා.
2. සතුන් සපයා ගැනීම පහසු වීම නිසා.
3. ජීවිතය දෙවියන් වහන්සේට අයිති වූ බැවින්.
4. එදා සමාජයේ සතුන් බහුලව පූජා කළ බැවින්.

23. නැගෙනහිර හා බටහිර ජර්මනිය වෙන් කළ බර්ලින් තාප්පය බිඳ දමා රට එක්සත් කිරීමට මූලික වූයේ ,
1. ශුද්ධ වූ අසිසියේ ප්‍රැන්සිස් මුනිතුමා.
2. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා.
3. ශුද්ධ වූ අගුස්තිනු මුනිතුමා.
4. ශුද්ධ වූ මැක්සිමිලියම් කෝල්බේ මුනිතුමා.

24. "මට ගෙයක් දෙන්න , මැරෙන්න වැටී සිටින අයව මං බලා ගන්නම් ." මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින්ද?
1. ජේසුගේ කුඩාමල තෙරේසා තුමිය.
2. ශුද්ධ වූ තෙරේසා මව්තුමිය.
3. තෙරේසා කන්‍යා සොයුරිය.
3. ශුද්ධ වූ ඇග්නස් තුමිය.

25. අප කරන සෑම පාපයකටම හේතු වන කරුණ කුමක්ද?
1. දෙවියන් වහන්සේ නොදන්නාකම.
2. දෙවියන් වහන්සේට යාච්ඤා නොකිරීම.
3. දෙවියන් වහන්සේව අවිශ්වාස කිරීම.
4. දෙවියන් වහන්සේට ගරු බිය නොපෑම.

26. දෙවියන් වහන්සේට දක්වන ගෞරවයේ ප්‍රේමයේ සළකුණක් වන්නේ මින් කුමක්ද?
1. තම හැකියා, දක්ෂතා මත පමණක් ක්‍රියා කිරීම.
2. දෙවියන් වහන්සේ මවා ඇති මැවිලි වලට දේවත්වයෙන් පිදීම.
3. බාරහාර හා පොරොන්දු ඉටු කිරීම.
4. යාච්ඤා කිරීම.

27. ඉරු දින ශුද්ධාවත් ලෙස ගත කිරීම සඳහා අප විසින් සිදු කළ යුතු පළමු ණය යුතුකම වනුයේ,
1. ශුද්ධ ලියවිල්ල මෙනෙහි කිරීමය.
2. දහම් පාසලට සහභාගි වීමය.
3. අසරණයන්ට පිහිට වීමය.
4. දිව්‍ය පූජාවට සහභාගි වීමය.

28. සියලු පවුල් වලට පරමාදර්ශය විය යුත්තේ කුමක්ද?
1. ශුද්ධ බයිබලය.
2. ශුද්ධ වූ ත්‍රිත්වය.
3. ශුද්ධාත්මයාණනන්.
4. ශුද්ධ වූ පවුලය.

29. තමාගේ සහෝදරයා සමඟ කෝප වන කවරකු වුවද යටත් වනුයේ
1. අධිකරණයටය.
2. ශ්‍රේෂ්ඨාධිකරණයට.
3. නිරාගින්නට.
4. විනිශ්චයට.

30. පූජා ප්‍රසාදි තුමෙකු , රදගුරු හිමිපාණන්ගෙන් අවසර ලබාගත යුතතේ කිනම් පාපයකට සමාව ලබා දීමේ දීද?.
1. සොරකම් කිරීම.
2. මත්පැන් පානය.
3. ගබ්සාව.
4. සියදිවි නසා ගැනීම.

31. තමන් මෙන්ම අනුන් ද 6 හා 9 පනත්වලට විරුද්ධව පාපයට නොපොළොඹවන අයුරින් කෙලෙස් දමනය කිරීම හඳුන්වනුයේ ,
1. පිරිසිදුකම.
2. හික්මවීම.
3. නිර්මල පැවැත්ම.
4. මර්යදාවය.

32. "තමන් සතු දේ භාවිතා කිරීමේ දී ඒවා හුදෙක් තමන්ගේම යහපත සඳහා පමණක් ම නොව අන් අයගේ යහපත සඳහා වන බව මතක තබා ගත යුතු" බව අපට පෙන්වා දෙන්නේ,
1. මහෝපදේශය තුළිනි.
2. ශුද්ධ බයිබලය තුළිනි.
3. කතෝලික සභා ධර්මෝපදේශය තුළිනි.
4. දෙවන වතිකානු ප්‍රකාශන තුළිනි.

33. ශුද්ධ වූ සභාවේ පාරම්පරික ලක්ෂණයක් ලෙස දැක්විය හැක්කේ මින් කුමක්ද?
1. යාච්ඤාවේ ජීවිතය.
2. දිළිදුන්ට දක්වන ආදරය.
3. අන් අය පිළිබඳ සංවේදි වීම.
4. අසරණ අයට පිහිට වීම.

34. අනනියස් සහ සපිරා දෙවියන් වහන්සේ ඉදිරියෙහි කළ පාපය වන්නේ
1. කෛරාටික කමේ පාපය.
2. වංචා කිරීමේ පාපය.
3. අල්ලස් ගැනීමේ පාපය.
4. රැවටීමේ පාපය.

35. ජනවන්දනා වර්ෂයේ දේව මෑණියන්ගේ සහ සාන්තුවරයන්ගේ මංගල්‍යයන් පවත් වන කාලය වනුයේ ,
1. සාමාන්‍ය සමය පළමු අදියර
2. සාමාන්‍ය සමය දෙවන අදියර
3. චතාරික සමය
4. ආගමන සමය

36. සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේ වෙත යොමු වන දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව ලෙස සලකනුයේ
1. ස්තෝත්‍ර යාගික යැදුම
2. පොදු යැදුම
3. පඩුරු මත යැදුම
4. බොදුනෙන් පසු යැදුම

37. විශ්ව කතෝලික සභාව සමග සහභාගිකමේ සංකේතයක් සනිටුහන් කරනු ලබන්නේ ,
1. මහ සිකුරාදා සිදුවීම.
2. පාස්කු මංගල්‍යය.
3. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය.
4. විවාහ මංගල භෝජනය

38. ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර කැටි කර ඇත්තේ,
1. දස පනත තුළ
2. ප්‍රාතිහාර්‍ය තුළ
3. භාග්‍ය අට තුළ
4. උත්තම පූජක යාච්ඤාවේ

39. සෑම වසරකම ජනවාරි මාසයේ 18 - 25 ත් දක්වා කාලයේ යැදුම් සතියක් පවත්වනු ලබන්නේ කුමක් සඳහා ද ?
1. අන්‍ය ආගම් උදෙසා.
2. රටේ සමගිය උදෙසා.
3. ලෝක සාමය උදෙසා.
4. සභා සමගිය උදෙසා.

40. ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්ති විස්තරයෙහි ඇති වැදගත් ස්ථානයක් හිමි වන සිදුවීම වනුයේ,
1. ගෙත්සෙමෙනි අත්අඩංගුවට ගැනීම.
2. ජේසුස් වහන්සේගේ කස පහර විදීම.
3. ජේසුස් වහන්සේගේ මරණය.
4. ජේසුස් වහන්සේගේ අපහාස විදීම.

(1x40=40)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 14 S II |
|---|---|---|

**කතෝලික ධර්මය II** — කාලය පැය දෙකයි

උපදෙස් :-

✶ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඉතිරි ප්‍රශ්න අතරින් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01.1. බබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සමාජීයීය හා ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ කරුණු සඳහන් ග්‍රන්ථ 2 ක වනුයේ කුමක් ද?
2. ලූක් තුමා , ශුද්ධ වූ පාවුළු තුමා සමඟ සම්බන්ධ වූ ධර්ම දූත චාරිකා 2 ක නම් කරන්න.
3. නව ගිවිසුමේ හසුන්පත් බෙදන ප්‍රධාන කොටස් 02 ක නම් කරන්න
4. ජේසුස් වහන්සේ ජුදයින් අතට පාවා දීමෙන් අනතුරුව විනිශ්චය සඳහා රැගෙන ගිය ස්ථාන 2 ක නම් කරන්න.
5. ලන්දේසි පාලන අවධියේ පැමිණි ඔරතෝරියානු පූජකවරුන් දෙදෙනා නම් කරන්න.
6. මිසරයේ දුක්විඳි ඉශ්‍රායෙල් ජනතාව බේරා ගැනීමට දෙවියන් වහන්සේ විසින් තෝරාගත් පුද්ගලයින් දෙදෙනා නම් කරන්න.
7. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට තමා සූදානම් විය යුතු ආකාර දෙක ලියන්න.
8. මිනිසා අන් මැව්ලිවලට වඩා වෙනස් වීමට හේතු වන කරුණු 2 ක ලියන්න.
9. ආගමන සමය බෙදෙන ප්‍රධාන කොටස් 2 ක නම් කරන්න.
10. පඬුරු පෙරහැරේදී රැගෙන එන පූදසුන මත තබන පඬුරු 2 ක නම් කරන්න (10x2=20)

02.1. ජීවිත හරය , එහි ගැටලු , විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහයන් ඇතුළත් ශුද්ධ බයිබලයේ ග්‍රන්ථ 2 ක නම් කරන්න.
2. ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප 3 ක් ලියන්න.
3. කිතුනු දරුවෙකු ලෙස ඔබ ප්‍රඥාවන්තව කටයුතු කළ අවස්ථා 5 ක් ලියන්න. (2+3+5=10)

03.1. ශුද්ධාත්ම ආගමනයත් සමඟ අපෝස්තුළුවරුන් තුළ සිදු වූ වෙනස්කම් 2 ක් ලියන්න.
2. උපස්ථායකයින් සතු ගුණාංග 3 ලියන්න.
3. මුල් කිතුනු සභාවේ ලක්ෂණ වර්තමාන සමාජය තුළ ඔබ ජීවත් කරවන ආකාරයන් 5 ක් ලියන්න. (2+3+5=10)

04.1. මහා බ්‍රහස්පතින්දා දින ජේසුස් වහන්සේ ස්ථාපිත කරන ලද දේව ප්‍රසාද නිධාන 2 ක් ලියන්න.
2. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ 3 ක් ලියන්න.
3. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පංගුකාර වන්නකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග 5 ක් ලියා විස්තර කරන්න.. (2+3+5=10)

05.1. දිව්‍ය පූජාව සිදු කිරීමට හේතු වන ප්‍රධාන කරුණු 2ක ලියන්න.
2. දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු 3 ක් ලියන්න.
3. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට ඔබ කරන යෝජනා 5 ක් ලියන්න. (2+3+5=10)

06.1. ලාඕස් (LAOS)හා එර්ගොන් (ERGON) යන්නෙහි අර්ථය ලියන්න.
2. ජනවන්දනාවේ ප්‍රධාන අංග 03 ලියන්න.
3. ජනවන්දනා වසරේ කාල වකවානු 5 ක් සඳහන් කරමින් ඒවායේ ඔබ කටයුතු කරන ආකාර 5 ක් කෙටියෙන් විස්තර කරන්න. (2+3+5=10)

07. පහත මාතෘකා 02ක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
1. ජීවන සහා සම්ප්‍රදාය
2. ශුද්ධ වූ පේදුරු තුමාගේ තුන් ප්‍රකාර කාර්යභාරය.
3. ජීවිතයට ගරු කරමු
4. උත්තම පූජක යාච්ඤාව (5+5=10)

## වර්ෂ අවසාන පරීක්ෂණය - 2018
## කතෝලික ධර්මය - 10 ශ්‍රේණිය
### පිළිතුරු පත්‍රය I

| | | | |
|---|---|---|---|
| 1. 2 | 11. 1 | 21. 1 | 31. 4 |
| 2. 3 | 12. 4 | 22. 3 | 32. 1 |
| 3. 1 | 13. 1 | 23. 2 | 33. 2 |
| 4. 4 | 14. 2 | 24. 2 | 34. 1 |
| 5. 2 | 15. 1 | 25. 1 | 35. 2 |
| 6. 4 | 16. 2 | 26. 3 | 36. 1 |
| 7. 1 | 17. 4 | 27. 4 | 37. 3 |
| 8. 3 | 18. 1 | 28. 4 | 38. 4 |
| 9. 1 | 19. 2 | 29. 1 | 39. 4 |
| 10. 2 | 20. 3 | 30. 3 | 40. 1 |

(ලකුණු 1 x 40 = 40)

### පිළිතුරු පත්‍රය II

01. 1. එස්රා හා නෙහෙමියා
2. දෙවන හා තෙවන චාරිකා
3. පාවුළු තුමාගේ ලිපි / වෙනත් ලිපි
4. උත්තම පූජකයාගේ මැදුර / ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය
5. ජුසේවාස් පියතුමා / ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා
6. මෝසෙස් / ආරොන්
7. ආත්මික සුදානම / ශාරීරික සුදානම
8. දේව ස්වරූපයට හා සමානකමට මිනිසා මැවීම / ජීවන හුස්ම දානය කිරීම
9. ක්‍රිස්තුන්වහන්සේගේ දෙවන පැමිණීම හෙවත් පරුසියාව / ක්‍රිස්තුන් වහන්සේගේ ඓතිහාසික ආගමනය
10. පූප / මිදියුෂ

02. 1. ජෝබ් / ධර්මදේශකයා
2. ප්‍රස්තාවපිරුළු / උපදේශ / කතාන්දර / සංකල්පනා / ගීත
3. නරක මිතුරු ඇසුරේදී
සණ්ඩු සරුවල් වීමේ දී
සත්‍ය ප්‍රකාශ කිරීම
අන් අයට පිහිට වීම වැනි දෑ සිසුවා ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

03. 1. අන්‍යභාෂා කථනය / ජීවිත වෙනස්වීම / එඩිතරව දේව වචනයේ සාක්ෂි කරුවන් වීම.
2. යහපත්දිවිපෙවෙතක් ගත කිරීම / ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම / ප්‍රඥාවෙන් පූර්ණ වීම.
3. දහම් පාසල තුළ බාල සහෝදර , සහෝදරියන්ට ඉගැන්වීම.
පොදු වැඩ කටයුතුවලට දායක වීම. / දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගී වීම.
නිවස තුළ යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම.
සියලු දේපොදුවේ තබා ගනිමින්බෙදාහදා ගැනීම වැනි කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න.

04. 1. දිව්‍යසත්ප්‍රසාදය / පූජකවරය
2. දේවප්‍රසාදනිධානයක් / භෝජනයක් / යාගයක් / ගිවිසුමක් / ස්තුති කිරීමක් / පරිස්මරණයක්
3. බැහැපත්කම , අවංකබව , කැඩිබිඳිවැයවීම , පරිත්‍යාගශීලි බව , නිහතමානිබව, දයාවආදි ගුණාංග
ලියා විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

05. 1. කල්වාරියාගය (කුරුසයාගය)සිහිපත්කිරීමකි / දිව්‍යභෝජනයේපිළිවෙත පැවැත්වීම (අන්තිමරාත්‍රී භෝජනය)
2. දෙවියන් වහන්සේට නමස්කාර කිරීම.
දෙවියන්වහන්සේට තුති පිදීම.
පාපයට වන්දි ගෙවීම.
ආත්මික හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම.
3. සම්පූර්ණ දිව්‍ය පූජාවට භක්තියෙන් සහභාගි වීම. රෝගීන් බලන්නට යාම.
ශුද්ධ ලියවිල්ල කියවීම. විවිධ සමිති සමාගම් වලට සහභාගි වීම.
වෙනත් දින වල ටවඩා යාච්ඤා කිරීම වැනි කරුණු ඇත්නම් ලකුණු දෙන්න.

06. 1.ලාඕස් - ජනතාව / එර්ගොන් - වැටුපක් නොලබා කරන සේවය

2. දිව්‍යපූජාව / දේවප්‍රසාදනිධාන / යාමයැදුම

3. ආගමන සමය :- ක්‍රිස්තුන්වහන්සේගේ ආගමනය බලාපොරොත්තුවෙන් ජීවිත වෙනස්කර ගැනීම.
නත්තල් සමය :- ක්‍රිස්තුන්වහන්සේගේ උපත තුළින් සාමය , පරිත්‍යාගය අත්දකින්නට ආරාධනා කරයි.
චතාරිකසමය :- මනස්ථාපනය තුළින් ජීවිත යථාර්ථය අවබෝධකර ගනී.
පාස්කු සමය :- ක්‍රිස්තුන්වහන්සේගේ උත්ථානයේ සාක්ෂිකරුවන් බවට අප පත්වේ.
සාමාන්‍ය සමය :- ක්‍රිස්තුන්වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය , ප්‍රාතිහාර්ය හා දේශනා සිහිපත් කරයි.
මෙවැනි කරුණු ඇත්නම් ලකුනු ලබාදෙන්න.

07. 1. **ජීවන සභාසම්ප්‍රදාය**
ජේසුස්වහන්සේ කළ කී බොහෝ දේවල් ශුද්ධ වූ සභා මාතාව විසින් අපට පිවන සභා සම්ප්‍රදාය ඔස්සේ දානය කරයි
දේව වචනයේ ප්‍රධාන මූලාශ්‍ර දෙකින් එකකි, ජීවන සභා සම්ප්‍රදාය
අපෝස්තුලුවරුන්ගේ සිට පැවත එන ඉගැන්වීම් අන්තර්ගත වේ.
කතෝලික සභාවේ අනන්‍යතාවය මැනවින් විදහා දක්වයි.
අපෝස්තුලුවරුන්ගේ සිට පැවත එන සභා සම්ප්‍රදායක් කතෝලික සභාව සතුයි.
ශුද්ධ බයිබලයේ අන්තර්ගත නොවන යමක් ශුද්ධ වූ කතෝලික සභාව අනුගමනය කරන්නේ ද ඒවා ජීවන සභා සම්ප්‍රදායෙන් ලැබී ඇත
(10 ශ්‍රේණිය 2/3 පිටුවල තවත් විස්තර ඇත)

2. **ශුද්ධ වූ පේදුරු තුමාගේ තුන්ප්‍රකාර කාර්භාරය**

| ජේසුස් වහන්සේ | පේදුරුතුමා | ජේසුස් වහන්සේ |
|---|---|---|
| ජොහාන්ගේ පුත්‍ර වූ සීමොන් මොවුනට වඩා ඔබ මට ප්‍රේම කරන්නෙහිද? | එසේය ස්වාමිනි, මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේක | මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න. |
| ජොහාන්ගේ පුත්‍ර වූ සීමොන් ඔබ මට ප්‍රේම කරන්නෙහිද? | එසේය ස්වාමිනි, මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේක | මාගේ බැටළු වන්ගේ එඬේරා වන්න. |
| ජොහාන්ගේ පුත්‍ර වූ සීමොන් ඔබ මට ප්‍රේම කරන්නෙහිද? | ස්වාමිනි ඔබ සියල්ල දන්නා සේක. මා ඔබට ප්‍රේම කරන බව ඔබ වහන්සේ දන්නා සේක. | මාගේ බැටළුවන් පෝෂණය කරන්න. |

3. **ජීවිතයට ගරු කරමු**
ජීවිතය දෙවියන් වහන්සේ විසින් ලබාදුන් තිලිණයක් බව
ජීවිතයෙහි අයිතිය දෙවියන් වහන්සේ සතු බව
දේව ස්වරූපයට හා සමාන කමට මවා ඇති බවත් ජීවන හුස්ම දෙවියන් වහන්සේ දානය කළ බවත්‍ය
ජීවිතය හා ශරීර සෞඛ්‍යය රැක ගත යුතු බව
ආහාර , වස්ත්‍ර , නිවාස , සෞඛ්‍ය , මූලික අධ්‍යාපනය රැකියා හා සමාජ සහයෝගය වැදගත් බව
පස් වන පනතට විරුද්ධ ක්‍රියාවලින් ජීවිතය රැක ගත යුතු බව
ආදී කරුණු ලියාඇත්නම් ලකුණු ලබාදෙන්න.

4.**උත්තම පූජක යාච්ඤාව**

ක්‍රිස්තුන් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේ දී තමන් වහන්සේගේ ශ්‍රාවකයන් ද පිරිවරා ගෙන ස්වර්ගික පියාණන් වහන්සේට කළ යාච්ඤාව බව/ ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර කැටි කර ඇත.

ජොහාන් 17 හි සඳහන් බව /උත්තම පූජක යාච්ඤාව පුරා දිව යන එක් ප්‍රධාන තේමාවක් වන්නේ එකමුතුකමයි.

I කොටස - තමන්වහන්සේ වෙනුවෙන් යාච්ඤා කිරීම

II කොටස - ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤා කිරීම

III කොටස - අනාගත සභාවේ එකමුතුව වෙනුවෙන් යාච්ඤා කිරීම ආදී කරුනු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.